'දෙවෙනි ඉනිම' වගේ නිර්මාණ නිසා ලංකාවේ නළු නිළියන්ට මිනිස්සු ආදරේ කරන්න ගත්තා

- ධර්මප්‍රිය ඩයස්

වේදිකාව, සිනමාව මෙන්ම ටෙලි නාට්‍යය ද ඔහු දක්ෂයෙකි. වේදිකාවෙන් ලැබූ පන්හරය ඔහුගේ ජීවිතයට තෝතලේගකි. මේ දිනවල ජනප්‍රියතම ටෙලි නාට්‍යයක් වන 'දෙවෙනි ඉනිම' ඔස්සේද ඔහුව දැක බලා ගැනීමට හැකියාව තිබේ. එමෙන්ම පසුගියදා වේදිකා ගත වූ 'හිතලා ගත්තු තීරණයක්' වේදිකා නාට්‍ය තුළින්ද ඔහු රසිකයන් අතරට පැමිණියේය. ඔහු නමින් ධර්මප්‍රිය ඩයස්ය. සිය කලා කටයුතු පිළිබඳව කතාබහ කිරීමට ඔහු 'අද' සමග මෙලෙස එක්විය.

■ සිලාන් ප්‍රිතාන්ත

? මේ දවස්වල මොකද වෙන්නේ

රාජිත දිසානායකගේ අලුත්ම වේදිකා නාට්‍යය වන 'හිතලා ගත්තු තීරණයක්' නාට්‍යයේ වැඩත් එක්ක තමයි මේ දවස්වල වැඩකටයුතු සිදුවෙන්නේ. එහි මංගල දර්ශනය 09 සහ 10 වැනිදා ලයනල් වෙන්ට්ඩ් එකේදී පැවැත්වුවා. ඒ කටයුතු එක්ක තමයි වැඩිපුර කාලය ගත කළේ.

? 'හිතලා ගත්තු තීරණයක්' සඳහා ලැබෙන ප්‍රතිචාර කොහොමද

ඉතා හොඳ ප්‍රතිචාර තියෙනවා. නාට්‍යයටත්, චරිතයක් නිරූපණය කරපු මටත්, අනෙක් රංගන ශිල්පීන්ටත් හොඳ ප්‍රතිචාර ලැබෙනවා. මං හිතනවා හැම දෙනාටම හොඳ ප්‍රතිචාර තියෙනවා කියලා. හැමෝටම ඒ ගැන සතුටු වෙන්න පුළුවන්.

? ඔබ වැඩිපුර දායකත්වය දෙන්නේ කුමන නිර්මාණයන්ද

ඇත්තටම මම වැඩිපුරම ඉඳලා තියෙන්නේ වේදිකාවේ. ආසම චිත්‍රපටවලට. නමුත් ඒ සඳහා වැඩිපුර දායක වෙලා නැහැ. ටෙලි නාට්‍යයවලට කැමතිත් නැහැ. අකමැතිත් නැහැ. හැබැයි වේදිකාවෙන් පස්සේ වැඩිපුරම දායක වෙලා තියෙන්නේ ටෙලි නාට්‍යවලටයි. හොඳ චරිතයක් ලැබෙනවා නම් ඕනම එකකට ඉතාමත්ම කැමතියි. දැනටත් ඉඳලා තියෙන අත්දැකීම් අනුව තමයි කියන්නේ.

? ඔබත් 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයෙන් ඉවත් වෙනවා කියන කතාව ඇත්තද

ඇත්තටම මම ඒ ගැන නම් දන්නේ නැහැ. ඒ කතාව බොරුවක්. තවම මට අයින් වෙන්න හේතුවක් නැහැ. 'දෙවෙනි ඉනිම' තුළින් විශාල ජනාදරයක් ලැබෙනවා. මම ඒකට ගරු කරනවා. නාට්‍යය දුර්වල වේගෙන එනවා නම් ඒ පිළිබඳව දැනුම්වත් කරන එක අපේ යුතුකමක් කියලා මම විශ්වාස කරනවා. මට හිතෙන්නේ දැනට ලංකාවේ වැඩිම ප්‍රේක්ෂක සංඛ්‍යාවක් බලන නාට්‍යය තමයි 'දෙවෙනි ඉනිම' කියන්නේ. යූට්යුබ්වලින් බලන අයත් එක්ක බලද්දී සමහර කොටස් ලක්ෂ 10 ඉක්මවලා තියෙනවා. ඒ කියන්නේ මෙය ලංකාවේ වැඩිපුර පිරිසක් නරඹන නාට්‍යය වෙලා තවමත් ඒක අඛණ්ඩව තියෙනවා. කාලෙන් කාලෙට සමහර ප්‍රේක්ෂකයෝ බලන්නේ නැති වෙනවා. තම තමන්ට රුචි විදිහට වැඩේ සිද්ධ වෙන්නේ නැහැ වගේ නම් සමහරු ඈත් වෙනවා. ඇත්තටම මේක විශාල වැඩක්, විශයන් ගොඩක එකතුවක්. රචනය, අධ්‍යක්ෂණය, නිෂ්පාදනය කියන දේවල් එක්ක බලද්දී ලේසි වැඩක් නෙමෙයි. අපි ඉන්දියන් ටෙලි නාට්‍යය බල බලම ඒවාට බණිනවා. ඉන්දියාවෙන් නළු නිළියෝ ආවා. අපි මෙහෙ ඉඳලා පැල්බැඳගෙන ගියා ඒ අයට අත වනන්න. ඊට වඩා 'දෙවෙනි ඉනිම' වගේ නිර්මාණ නිසා අපේ රටේ මිනිස්සු, ලංකාවේ කොල්ලන්ට කෙල්ලන්ට ආදරය කරන්න පටන් අරන් තියෙනවා. තරුව සංකල්පයෙන් හිතලා බැලුවොත් ඉන්දියානු අයට ආදරය කරන එක අද ලංකාවේ අයට ලැබිලා තියෙනවා. ඒ ජනාදරයේම කොටසක් මටත් ලැබිලා තියෙනවා. මොකද ඒක තුළ අපි කරන චරිතය නිසා. 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍ය ජනගත වීම තුළින් මේ කියන දේවල් වුණා. නිර්මාණයේ අඩුපාඩුකම් තියෙනවා නම් කතාබහ කරලා හදාගෙන ඉදිරියට යන්න පුළුවන් නම් හොඳයි. මේක නැවැත්තුවොත් වෙන්නේ මේ හදා ගත්ත දේ නැති වෙනවා. ආයේ මුල ඉඳලම කෙනෙකුට පටන් ගන්න වෙනවා.

? 'දෙවෙනි ඉනිම' නාට්‍යය රැල්ල හේතුවෙන් අනෙකුත් නිර්මාණ සඳහා වැඩි ඉඩක් මාධ්‍ය තුළින් ලැබෙන්න ගත්තා නේද

දෙවෙනි ඉනිම ජනාදරයට පත් වුණා කියලා ඒකම කිය කිය ඉන්න ඕනේ නැහැ. අතීත් නිර්මාණකරුවෝ, අතීත් නාළිකාවලින් තව තව අලුත් මානයන්, අලුත් අදහස් සහ අලුත් පිටපත් එක්ක මහන්සි වෙලා වැඩකරා නම් හරි. 'දෙවෙනි ඉනිම' වගේම ඒවා ආයේ කරන්න ඕනේ නැහැ. එක කාලයක් 'කුඹියෝ' රැල්ලක් ආවා. ටෙලි නාට්‍යය කලාව කණපිට පෙරළුවා. හමුත් ඒක අවුරුදු දෙකහමාරක් තුනක් විතර කිසිම නාළිකාවකින් විකාශය කරන්න ගත්තේ නැහැ. කට්ටිය බය වුණා. හැබැයි විකාශය වුණායින් පස්සේ හිතා ගන්න බැරි වුණා. නාළිකා මට්ටමින් බුද්ධිමත් වෙන්න ඕනා. අලුත් අලුත් දේවල්වලට අත ගහලා, ඒ දේවල් විකාශය කරලා පාඩු වෙන්නේ නැහැ කියන තැන ඉන්න ඕනේ. හැබැයි ඒකට නිර්භීතකම තියෙන්නත් ඕනේ සහ ඒක හඳුන ගන්න හැකියාව සහ ඉව තියෙන්නත් ඕනේ. කවුරු හරි හාමුදුරුතමක් දාලා නාට්‍යයක් කරලා ජනප්‍රිය වුණොත් අන්න ආයේ අපිත් දානවා හාමුදුරුවෝ කෙනෙක්. ඒවගේ දේවල් කරන්න නරකයි. ලෝකයේ තව තව දේවල් තියෙනවා නිර්මාණක් ඇතුළේ කතාකරන්න. වැනල්වල ඕවා තෝරන අයට හැකියාව තියෙන්න ඕනේ මේ දේවල් තෝරලා බේරලා ගන්න. ඒක නැතිකම තමයි අපිට මෙච්චර වැරදුනේ කියලා තමයි මට හිතෙන්නේ.

? වර්තමාන කලා ක්ෂේත්‍රය පිළිබඳ ඔබේ අදහස

කලා ක්ෂේත්‍රය ගැන කියනවා නම්, කවදත් අලුත් පරපුර එකතු වෙනවානේ. ඒ දේ නම් සිද්ධ වෙනවා. නවකතා ගත්තත්, චිත්‍රපට ගත්තත්, ඡායාරූප ගත්තත් අවුරුද්දෙන් අවුරුද්ද දේවල් එකතු වෙනවා. අලුත් නිර්මාණ එකතු වෙනවා. ඒක මට ලොකු විශ්ලේෂණයක් කරන්න තරම් දෙයක් නැහැ කියලා හිතෙනවා. හැබැයි, නිර්මාණකරුවෝ බිහිවෙන්න ඕනේ ජනතාවගේ පැත්තෙන් දකින අය මිසක්, දේශපාලකයන්ගේ ඇහෙන් සමාජය දකින නිර්මාණකරුවෝ නෙමෙයි.

? චිත්‍රපට සඳහා වැඩි කැමැත්තක් තිබුණත් ඇයි චිත්‍රපට සඳහා අඩු දායකත්වයක් ලබා දෙන්නේ? නිර්මාණ සඳහා ආරාධනා ලැබෙන්නේ නැද්ද

චිත්‍රපටයකට අඩ ගැහැව්වොත්, මට හොඳයි කියලා හිතෙනවා නම් මම දායක වෙනවා.

? ඒ කියන්නේ තෝරා බේරා ගැනීම් එක්තරයි නිර්මාණවලට දායක වෙන්නේ

මෙහෙම දෙයක් තියෙනවා. කොහොමත් කලින් පිටපතක් කියවලානේ ඕනෑම නිර්මාණයකට දායක වෙන්නේ. වේදිකා නාට්‍යයක් වුණත් එහෙමනේ. පිටපතක් කියවනවා කියන්නේ, චරිත තෝරා බේරා ගැනීමක් කරනවා එහෙම නෙමෙයි. වැඩේ කොහොමද? සුදුසු දෙයක්ද කියන දේ තීරණය කරන්න ඕනේ අනිවාර්යෙන්ම. ඒ වගේම තමයි ඒ තුළින් මම සතුටු වෙනවාද කියන කාරණාව බලන්න ඕනේ. මම සතුටු වෙන්නේ නැත්නම් කරලා වැඩක් නැහැනේ. මට හිතෙනවා මගේ තරුණ කාලේ මීට වැඩිය චිත්‍රපටවලට දායක වෙන්න ලැබුණා නම් හොඳයි කියලා. ඒ කාලේ ලොකුවට චිත්‍රපට කර්මාන්තය තුළ චිත්‍රපට හැදුනෙත් නැහැ. දැන් මේ ඩිජිටල් තාක්ෂණය එක්ක හෝ දැන් සරුණ පරම්පරාව චිත්‍රපටවලට අතගහලා තියෙනවා. කර්මාන්තයක් විදිහට මේක ගොඩ නැගෙන්න තව ගොඩාක් දුර යන්න ඕනේ. ඒක එහෙම වෙන එක අපිට වගේම රටටත් හොඳයි.



? වර්තමාන රසිකයන්ගේ වේදිකාවට ඇති හැඹුරුව කොහොමද

වේදිකා නාට්‍යවලට කවදාකවත් අපිට නම් ප්‍රේක්ෂකාගාරයේ අඩුපාඩුවක් වෙලා නැහැ. මම අවුරුදු 20ක් විතර වෙනවා නාට්‍යය කරන්න පටන් අරගෙන. මම සම්බන්ධ වෙච්ච කිසිම නිර්මාණයකට ප්‍රේක්ෂකාගාරයේ අඩුපාඩුවක් වෙලා නැහැ. ඒක තවදුරටත් අලුත් වුණා රාජිත දිසානායකගේ 'හිතලා ගත්ත තීරණයක්' නාට්‍යයේ මංගල දර්ශන දෙකම බලන්න හවුස් ෆුල් වෙන්නම සෙනඟ ආවා. රටේ කොයිතරම් වාතාවරණයක් තිබිලත්, මොන දේශපාලන තත්ත්වයක් පැවතුනත්, එහෙම සෙනඟක් එක්ක ප්‍රේක්ෂකාගාරය පිරෙන එක ගැන මට සතුටක් තියෙනවා.

? ඉදිරි නිර්මාණ සහ බලාපොරොත්තු ගැන කිව්වොත්

ලබන අවුරුද්දේ නාට්‍යයක් අධ්‍යක්ෂණය කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. තාම හරි තීරණයක් නැති වුණත් ලබන අවුරුද්දේ කරනවා. දැනට නම් ඒවගේ අදහසක් තමයි තියෙන්නේ. ඊට අමතරව ප්‍රියන්ත කළුආරච්චිගේ ' රතු සමිතල සිහිනයක්' චිත්‍රපටය, අශෝක හඳගමගේ 'අසංධිමිත්තා' චිත්‍රපටය, අසම කියලා මල්ලී කෙනෙක්ගේ 'කොලම්බෝ' චිත්‍රපටය වගේ නිර්මාණ කිහිපයක් එන්න තියෙනවා. තව ටෙලි නාට්‍යය කිහිපයක් එන්න තියෙනවා. ඒ වගේම වේදිකා නාට්‍යයක් කරන්න හිතන් ඉන්නවා.

Scan with EasyScan